# කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

# නීති පීඨය

# නීතිවේදී උපාධි පරීක්ෂණය, සිව්වන වසර-2021-(මාර්ගගත)

# මානව හිමිකම් නීතිය

(පැ තුනයි)

සම්පූර්ණ ප්‍රශ්න සංඛ්‍යාව: 06

## <u>ඕනෑම ප්‍රශ්න තුනකට (03) පමණක්</u> පිළිතුරු සපයන්න.

(අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.)

---

1. සුයා, මායා හා ලායා යනු සුයාම ජනරජයේ සිටින දේශීය ජන වර්ග ත්‍රිත්වයකි. ඔවුන් රට පුරා විසිරී ජීවත් වෙති. මායාවරුන් ඓතිහාසික සම්ප්‍රදායන් අනුගමනය කරන අතර, ලයාන්වරු නිදහස් චින්තකයින් වෙති. සුයා ප්‍රජාවට අයත් සුලක්ෂියා , සුයාමා හී අගමැතිවරයා වේ. ජනවර්ග ත්‍රිත්වයම අතර ඒකවිධ නීතියක් තහවුරු කිරීම පිණිස ඔහු විසින් "සමාන අනාගතයක්" නමින් ජාතික ප්‍රතිපත්තියක් යෝජනාකර තිබේ. මෙම ප්‍රතිපත්තියට විරුද්ධව සුයන්වරු කණ්ඩායමක් ප්‍රතිරෝධය දක්වමින් කියා සිටින්නේ සුයාම රාජ්‍යයේ පැරණිතම සංස්කෘතිය ඔවුනට හිමි බවයි. එසේම, සෙසු ජනවර්ග සුභාන්වරුන්ට වඩා සම්පූර්ණයෙන් වෙනස් බැවින් ඔවුන් සමානයන් ලෙස සැලකිය නොහැකි බවට ඔවුහු තර්ක කරති.

   ප්‍රතිපත්තියට එකගනොවන මායාවරුන් ප්‍රකාශකර සිටින්නේ, ශතවර්ෂ ගණනාවක් පුරාවට රැකගත් සම්ප්‍රදායක් වන කාන්තා සුන්නත්කරන සම්ප්‍රදාය අතහැරීමට ඔවුන් සූදානම් නැති බවයි. පිළිවෙලින්, තම ස්වාමි පුරුෂයා හා පියවරුන් වන්දනා කිරීමට මායා ජනවර්ගයේ බිරින්දෑවරුන්ට හා දියණිවරුන්ට අනිවාර්ය කෙරෙන චාරිත්‍ර විධි පිළිබඳව මායා ජනවර්ගයේ පුරුෂයන් ආඩම්බර වෙති. කාන්තා මායාවරුන්ට, තම විවාහයට කැමැත්ත ප්‍රකාශ කිරීම පිළිබඳ අයිතිවාසිකමක් හෝ ඔවුන් විසින් උපයා ගනු ලැබූ දේපලක් හෝ උරුමයෙන් ලැබූ දේපලක් පිළිබඳ අයිතිවාසිකමක් නොමැත.

   ලායාන්වරු කණ්ඩායමක් සමලිංගික විවාහ පිළිගැනීම ප්‍රවර්ධනය කරන අතර සීමා නොකරන ලද ගබ්සාකිරීම් පිළිබඳ ව්‍යවස්ථාවක් සඳහා වූ යෝජනා කරයි. අගමැතිවරයා විසින් යෝජනා කරන ලද ජාතික ප්‍රතිපත්තියට ලායාන්වරු සහයෝගය දක්වති.

   ඉහත තත්වය මානව හිමිකම් පිළිබඳ දාර්ශනික ප්‍රවේශ සහ නියාමයාත්මක රාමුව ඇසුරින් විශ්ලේෂණය කරන්න.

   (ලකුණු 100)

2. වසංගත සමය තුළ ජනතාවගේ හැසිරීම් විධිමත් කිරීම පිණිස තමාෂා රාජ්‍යය වසංගත (විශේෂ විධි විධිවිධාන) පනත නමින් පනත් කෙටුම්පතක් යෝජනා කර තිබේ. එම කෙටුම්පතෙහි පහත දැක්වෙන ප්‍රතිපාදන ඇතුළත් වේ:

අ) ආගමක් හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සහ අයකුගේ ආගම හෝ විශ්වාසය ඇදහීමේ නිදහස පනතේ සඳහන් නිසිබලධාරියා විසින් තීරණය කරනු ලබන සීමාවන්ට යටත් වේ.

ආ) නිශ්චය කරන ලද එන්නත්කරණයෙන් තොරව කිසිදු පුද්ගලයකුට තම නිවසින් බැහැර වීමට අවසර නොමැති අතර, තම නිවසින් බැහැරව යන විට ඔවුන් විසින් ස්වකීය එන්නත්කරණ කාඩ්පත ස්වකීය සන්තකයේ තබා ගත යුතුය.

ඇ) වසංගත රෝගය වැළඳී ඇති බවට නිශ්චය කර තිබෙන කිසිදු තැනැත්තෙකු, සෞඛ්‍ය අධිකාරීන් විසින් සඳහන් කර තිබෙන සෞඛ්‍ය මධ්‍යස්ථානයකට හැර වෙනත් කිසිදු මධ්‍යස්ථානයකට ඇතුලත් කර නොගත යුතුය. මහජන දැනුවත්භාවය නිර්මාණය කිරීම පිණිස ආසාදිත තැතැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් විවෘත දත්ත පද්ධතියට ඇතුලත් කළ හැකිය.

ඈ) මෙම පනතේ ප්‍රතිපාදනපාදන යටතේ තමාෂා රාජ්‍යයේ ජනාධිපතිවරයාට හදිසි අවස්ථා රෙගුලාසි සෑදීමට බලය ලබා දී තිබේ. එකී රෙගුලාසි වලට වෙනත් ඕනෑම නීතියක ප්‍රතිපාදන අභිබවා යෑමේ, සංශෝධනය කිරීමේ හෝ අත්හිටුවීමේ නෛතික බලය ඇත.

ඔබ, මානව හිමිකම් සංවිධානයක උපදේශකයෙකු බවත්, පනත් කෙටුම්පතේ ඉහත සඳහන් ප්‍රතිපාදන පිළිබඳ අන්තර්ජාතික හා දේශීය මානව හිමිකම් හා නීති දේහයන් ඇසුරින් වාර්තාවක් ලිවීම ඔබට පවරා තිබෙන බවත්, උපකල්පනය කරන්න. තමාෂා රාජ්‍යයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සමාන වේ. ඔබගේ වාර්තාව ලියන්න.

(ලකුණු 100)

3. වර්ෂ 2015 දී, රාජ්තාන් රාජ්‍යයේ හමුදාවන් විසින්, හේලී විශ්වාසයෙහි ස්වයං නිර්ණය අයිතිය වෙනුවෙන් පෙනී සිටි, සන්නද්ධ ආගමික කණ්ඩායමක් වන, හේලී හමුදාව පරාජය කරන ලදී. මෙම පරාජයට පෙර, හේලී හමුදාව ස්වභාවික සම්පත් වලින් පොහොසත් දුරබැහැර කලාපයක් වූ රාහුල් පාලනය කරන ලදී.

අ) හේලී සටන්කරුවන් ගණනාවක් රඳවාගෙන සිටියි. මෑතකදී මෙම රැඳවියන් පුනරුත්ථාපනය කිරීම පිළිබඳ තීරණය ගැනීමට ආරක්ෂාව පිළිබඳ අමාත්‍යවරයාට අවසර ලබා දෙමින් ආණ්ඩුව විසින් රාජ්තාන් ජාතික ආරක්ෂක නීතිය යටතේ රෙගුලාසියක් හඳුන්වා දෙනලදී.

ආ) රාජ්තාන් ආණ්ඩුව බහුජාතික සමාගමක් වන ඕිලා සමග ගිවිසුම්කට එළඹෙමින් රාහුල් ප්‍රදේශයේ ඇති ඛනිජ කැනීම් සඳහා ඕිලාට අවසර දෙනලදී. ඕිලා හී ක්‍රියාකාරකම් හේතුවෙන්, රාහුල් ප්‍රදේශයේ වාතය දූෂණය වෙන අතර ස්වශනාශ්‍රිත රෝගාබාධයන්හි වැඩිවීමක් වාර්තා වී ඇත. මෙම කැණීම් කටයුතු හේතුවෙන් රාහුල් ප්‍රදේශයේ වනාන්තර විනාශ කෙරෙන අතර එහි ප්‍රතිඵලයක් ලෙස 20 දෙනෙකුට මරුකැඳවමින් හා නිවාස විනාශ කරමින් නාය යෑමක් සිදුවිය.

ඇ) හේලී හමුදාව නැවත හිසඑසවීම වැළැක්වීම පිණිස, රාජ්තාන් ආණ්ඩුව විසින් සන්නද්ධ අරගලය සිහිකිරීමේ කටයුතු සහ හේලී හමුදාවේ කිසිදු මියගිය සාමාජිකයෙකුගේ මරණය සැමරීම තහනම් කර ඇත.

ඈ) නව වෛරසයක් ආසාදනය වූ පදිංචිකරුකරුවන් කිහිප දෙනෙකු රාහුල් ප්‍රදේශයෙන් හඳුනාගෙන තිබේ. මෙම වෛරසය 40% මාරාන්තික වේ. මෙම වෛරසය පැතිරීම වැළැක්වීම පිණිස රාජ්තාන් ආණ්ඩුව හවස 4.00 සිට පසුදා උදෑසන 6:00 වන තුරු ජෛව ආරක්ෂණ නීතිය යටතේ දෛනිකව ඇඳිරි නීතිය ප්‍රකාශයට පත්කර තිබේ. ජෛව ආරක්ෂණ නීතිය තුළ ඇඳිරි නීතිය ප්‍රකාශයට පත් කිරීමට අදාල ප්‍රතිපාදන නොමැත.

ඉ) ජනමාධ්‍යවේදිනියක වන ජෙනා, රාහුල් හි ඇති රෝහල් ඇඳන් සංඛ්‍යාව පිළිබඳව තොරතුරු සෞඛ්‍ය අමාත්‍යංශයෙන් අයදුම්කර තිබේ. සෞඛ්‍ය අමාත්‍යාංශය ජාතික ආරක්ෂාව යන පදනම්් මෙම තොරතුරු ලබා දීමේ ප්‍රතික්ෂේප කර තිබේ.

රාජ්තාන් රාජ්‍යයේ පවත්නා මානව හිමිකම් ගැටළු හඳුනාගෙන, ඒවා මානව හිමිකම් නීතිය ඇසුරින් අගයන්න.

(ලකුණු 100)

4. යෝගා රාජ්‍යයේ පොලිස් නිලධාරිනියක් වන රීටා, ඇයගේ ඊළඟ උසස්වීම සඳහා අයදුම් කරන නමුත් ඇයගේ අණ දෙන නිලධාරියා (අ) කාන්තාවන්ට තනතුරු 10% පමණක් පවතින අතර ඉන් එකක්වත් මේ වන විට හිස් වී නොමැත, (ආ) ඇය උස අවශ්‍යතාවය වන අඩි 5 යි අඟල් 6 සපුරා නොමැති බව, සඳහන් කරමින් ඇයගේ අයදුම්පත නැවත හරවා එවයි. මෙම උසස්වීම සඳහා වන සෙසු අවශ්‍යතාවන්නේ 20 වසරක සේවාකාලයක් සපුරා තිබීම හා පොලිසියට සම්බන්ධ පශ්චාත් උපාධියක් සම්පූර්ණ කර තිබීමයි. රීටා එම අවශ්‍යතා සපුරාතිබේ. මෑතකදී යෝගා හි මානව හිමිකම් කොමිසම රටේ අපරාධ යුක්ති පද්ධතිය පිළිබඳව වාර්තාවක් එළි දැක්වූ අතර ලිංගික ප්‍රචණ්ඩත්වයට අදාළ අපරාධයන්හි අවම දඬුවම් කිරීමේ ප්‍රතිශතයට හේතු ලෙස වින්දිතයන් විසින් පැමිණිලිකිරීමට මැළිවීම සහ විමර්ශන ක්‍රමවේදයන්හි අකාර්යක්ෂමතාවය යන්න සඳහන් කර තිබිණි. තවදුරටත් දක්වා තිබුණේ රටේ කුඩාම වාර්ගික කණ්ඩායමක් වන රගූ ජනවර්ගය, පොලිස් කාර්යමණ්ඩලය තුළ නියෝජනය

නොවන බවයි. පොදුවේ පොලිසියට බඳවා ගන්නන්හට ලැබෙන පුහුණුවීමේ අප්‍රමාණවත්භාවය පිළිබඳව කොමසම තම කනස්සල්ල සටහන් කර තිබේ. විශේෂයෙන්ම පොලිසියේ පුහුණුකරුවකු විසින් සමලිංගිකත්වය හෙළා දකිමින් සිදුකරන ලද ප්‍රකාශය පිළිබඳව වාර්තාව මගින් විවේචනය කර තිබේ. යෝගා රාජ්‍යය තුළ " අස්වාභාවික ලිංගික ක්‍රියාවල නිරතවීම" අපරාධමය වරදකි.

මෙම අවස්ථාව තුළ පවත්නා මානව හිමිකම් ගැටළු හඳුනාගනිමින් විශ්ලේෂණය කරන්න.

(ලකුණු 100)

5. කලාපීය මානව හිමිකම් යාන්ත්‍රණය නිර්මාණය කර තිබෙන්නේ ලෝකයේ විවිධ කලාපයන්හි පවත්නා සුවිශේෂී මානව හිමිකම් ගැටළු ආමන්ත්‍රණය කිරීම පිණිස වේ. මෙම යාන්ත්‍රණයන් ආර්ථික සාමාජයීය හා සංස්කෘතිකමය අයිතිවාසිකම් වඩා ඉහළ මට්ටමකින් ඇතුලත් කර ගැනීමටද හැකියාව ලබා ඇත.

ඔබ එකගවන්නෙහිද? තම කලාපයන් තුළ ආර්ථික සමාජ හා සංස්කෘතිකමය අයිතිවාසිකම් ප්‍රතිඵලදායී ලෙස ආරක්ෂා කිරීමට හැකිවී තිබෙන්නේ කෙසේදැයි තෝරාගත් කලාපීය යාන්ත්‍රණයන් ද්විත්වයක් ඇසුරින් සංසන්දනය හා විසංසන්දනය කරන්න. තෝරාගත් කලාපීය මානව හිමිකම් යාන්ත්‍රණයන් හි මානව හිමිකම් ලේඛන තුළින් ඇඳාගත් නිශ්චිත උදාහරණ මගින් ඔබගේ පිළිතුර තහවුරු කළ යුතුය.

(ලකුණු 100)

6. සාමා මෙගාලන්තයේ මානව හිමිකම් ක්‍රියාකාරිනියකි. වසංගත සමය තුළ රටේ උද්ධමනය හා දූෂණයට එරෙහිව නිහඬ මහජන විරෝධතාවක් ඇය සංවිධානය කරනලදී. මෙම විරෝධතාවයේ අංගයක් ලෙස සාමා සහ ඇගේ මිතුරන් විසින් ජනතා අභිලාෂයන් ඉටු කිරීම විෂයයෙහි පවත්නා ආණ්ඩුවේ අසමත්කම විවේචනය කරමින්, සමාජ මාධ්‍ය ජාලා වෙත නිර්මාණ උඩුගත කරන ලදි. එක් නිර්මාණයක් පැය කිහිපයක් ඇතුළත දී සමාජ මාධ්‍ය ජාලා තුළ ඉහළ අවධානයක් දිනා ගනිමින් සීඝ්‍ර සංචරණය සිදුවිය.

අ) මෙම සමාජ මාධ්‍ය ජාලා විරෝධතාවේ දෙවැනි දිනයේ දී, ජාතික සයිබර් අපරාධ මැඩලීමේ ඒකකය සාමා වෙත පැමිණ ඉල්ලා සිටියේ මේ දක්වා ඇය විසින් හුවමාරු කරගෙන ඇති සියලුම නිර්මාණ ඉවත් කරගන්නා ලෙසයි. මෙම ඒකකයේ නිලධාරීන් තවදුරටත් සමාජ ජාලා විරෝධතාවය පවත්වාගෙන නොයන ලෙස තර්ජනය කරමින් කියා සිටියේ, ඒ හරහා මෙම අසීරු කාලපරිච්ඡේද දී මහජන සදාචාරය මත සෘණාත්මක බලපෑමක් ඇති කරන බවයි.

ආ) සාමාට තර්ජනය කරන ලද දිනයේදී ම සාමාගෙ සගයන් දෙදෙනකු වන රාජා හා දිල්ශාන් කිසිදු හේතුවක් නොදන්වා පොලිසිය විසින් අත්අඩංගුවට ගන්නා ලදී. මොවුන්ගේ පවුලේ සාමාජිකයන් කියා සිටින්නේ රාජා හා දිල්ශාන් විසින් විරෝධා ව්‍යාපාරයට අදාළව තම සමාජමාධ්‍ය ජාලා වෙත මුදාහැර තිබූ නිර්මාණ පෙන්වමින්

ඔවුන්ගේ අසල්වැසියන්ගෙන්න රාජා හා දිල්ශාන් පිළිබඳව පොලිස් නිලධාරීන් තොරතුරු විමසා ඇති බවයි.

ඇ) ඉන් දින දෙකකට පසුව, රාජා සහ දිල්ශාන් ව ඔවුන්ගේ ආසාදිත බව පරික්ෂා නොකරම ආණ්ඩුවේ නිරෝධායන මධ්‍යස්ථානයක් වෙත ගෙන ගොස් ඇති බව සාමා දැනගත්තාය. රාජා සහ දිල්ශාන් දින 14ක් නිරෝධායන මධ්‍යස්ථානයේ රැඳී සිටීමට නියමිතව තිබුණද, නිරෝධායනය කාලය පටන් ගෙන දින හතක් තුළ ඔවුන් දෙදෙනාවම බරපතළ තුවාල සහිතව රෝහල්ගත කරන ලදී. පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කියා සිටියේ ඔවුන් දෙදෙනා නිරෝධායනය සඳහා යොමු කළ දිනයේදීම නිරෝධායන මධ්‍යස්ථානයෙන් පලාගොස් ඇති බවයි.

ඔබ නීතිඥවරයෙකු බව උපකල්පනය කරමින් , උල්ලංඝනය වී ඇති අයිතිවාසිකම් හඳුනාගෙන මෙගාලන්තයේ අන්තර්ජාතික මානව හිමිකම් වගකීම් ඇසුරින් ඒවා විශ්ලේෂණය කරමින්, සාමා, රාජා හා දිල්ෂාන්ට උපදෙස් දෙන්න. මෙගාලන්තය සියලුම ප්‍රධාන අන්තර්ජාතික මානව හිමිකම් ලේඛන අපරානුමතකර ඇති බව උපකල්පනය කරන්න.

(ලකුණු 100)

*************